


ගුරුවරිය **අයුබෝවන් පුතේ... මම ඔයාගේ පන්තිභාර ගුරුතුමිය**

පුතා **අයුබෝවන් ටීචර් මම ......................................................................**

ගුරුවරිය **අද ඉඳන් මම තමයි ඔයාගේ දෙවෙනි අම්මා... මේ තමයි ඔයාගේ දෙවෙනි ගෙදර...**



ගුරුවරිය **පුතාගේ ඉස්කෝලෙ පටන් ගෙන තියෙන්නේ,
1952 පෙබරවාරි 02 දා. මේ තමයි ඉස්කෝලේ පළවෙනි
විදුහල්පතිතුමා වුණ ඩී. බී. කුරුප්පු මහත්තයා...**




පුතා ඇයි ටීචර් අර අයියලා ගේට්ටුව ගාවදී බිම අල්ලලා වඳින්නේ


ගුරුවරිය තමුන් ආදරය කරන බිමකට ඇතුල් වෙනකොට එහෙම තමයි.





ගුරුවරිය **පුතේ ඉසිපතනය කියන්නේ විවිධ ආගම්, ජාතිවල දරුවන් ඉගෙන ගන්න පාසලක්... සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ හාම ජාතියකම අයියලා ඉන්නවා. ඒ ඔක්කොම එක මාලයක මුතු ඇට වගේ.**



ගුරුවරිය එන්න පුතේ අපි ඉසිපතනයේ ඇවිදින්න යමු...




ගුරුවරිය **මේ තියෙන්නේ පුතේ ඉසිපතනයේ බුදු මැදුරු**



ගුරුවරිය **මේ තියෙන්නේ කෝන් ගහක්... මේක ඉසිපතනයට වඩා වයසයි... ඉසිපතනයට මේ කෝන් ගහත් වටිනා සංකේතයක්.**




ගුරුවරිය දැන් මං කියන්නං පුතාගේ ඉස්කෝලේ නිවාස හතර ගැන. එකක් රාහුල. ඒ හාමුදුරුවෝ ලංකාවේ. තව එකක් මිල්ටන්. එතුමා එංගලන්තෙ. තාගෝර්තුමා ඉන්දියාවේ. ඉක්බාල් මහත්තයා පකිස්තානෙ ඉපදිච්ච කෙනෙක්. ඒ අය ඔක්කොම ලෝක සාහිත්‍ය වෙනුවෙන් ගොඩක් වැඩ කරපු උත්තමයෝ. මේ තියෙන්නෙ පිංතූර...



ගුරුවරිය **එන්න අපි ක්‍රීඩා පිට්ටනිය බලන්න. ඉසිපතනේ ගොඩාක් ක්‍රීඩා තියෙනවා. අයියලා සෑහෙන්න මහන්සි වෙලා ගොඩක් ජයග්‍රහණ අරන් දීලා තියෙනවා.**




ගුරුවරිය **ඉසිපතනය කියනකොට මතක් වෙන තවත් ක්‍රීඩාවක් තියෙනවා.**

පුතා **රගර්...**

ගුරුවරිය **හරියටම හරි. ඉසිපතනයෙ තමයි රගර් ක්‍රීඩාවේ අති දක්ෂයෝ ඉන්නේ. හැබැයි රගර් විතරක්ම නෙමෙයි. ඉසිපතනයේ දරුවන් හැම ක්‍රීඩාවකටම එක වගේ දක්ෂයි.**



ගුරුවරිය **මේ තියෙන්නේ පිහිනුම් තටාකය.**




ගුරුවරිය **ඉසිපතනේ දරුවෝ කියන්නේ අධ්‍යාපනයට, ක්‍රීඩාවට දක්ෂ, හොඳ විනයක් තියෙන, ගහකොළට, රටට, ආදරේ කරන, අනිත් අයට උදව් කරන කට්ටියක්.**



ගුරුවරිය **එන්න අපි විදුහල්පතිතුමාව හම්බවෙන්න යං...**

පුතා **ආයුබෝවන් සර්**

විදුහල්පතිතුමා **ආයුබෝවන් මගේ පුතේ, ඉසිපතනේට ඔයාව ආදරයෙන් පිළිගන්නවා... හොඳට ඉගෙන ගෙන, හොඳට ක්‍රීඩා කරලා, රටට වැඩදායී පුරවැසියෙක් වෙන්න කියලා මං පුතාට ආශිර්වාද කරනවා.**


ගුරුවරිය
**අපි දැං යමු පුතාගේ පන්ති කාමරයට...**
**මම තමයි පුතේ, පුතාගේ දෙවෙනි අම්මා.**

ගුරුවරිය **පුතා මුලින්ම ඉසිපතනෙට ආවේ මෙන්න මෙහෙම...**

**මගේ නම ...........................................................**

ගුරුවරිය **මේ ඉසිපතනේ ලාංඡනය... මේ ලාංඡනය ඇතුලේ තමයි ඉසිපතනේ ආදර්ශ පාඨය තියෙන්නේ...**

**""දළහං පග්ගණ්හ විරියං" ඒකේ සිංහල තේරුම තමයි,**
**"අදිටනින් වෙර වඩමු"**
**ඕක හැමතිස්සෙම මතක තියා ගත්තොත් කවදාවත් මගේ පුතාට වරදින්නේ නෑ...**